*සැ. යු.*- 2018.10.05 දින පළ වූ අංක 2,092 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,093 - 2018 ඔක්තෝබර් මස 12 වැනි සිකුරාදා - 2018.10.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 1536 |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 නොවැම්බර් මස 02 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ඔක්තෝබර් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# අතුරු ව්‍යවස්ථා

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් ලැබී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් සභා පරිපාලන බල ප්‍රදේශයේ රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව, ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ ආණ්ඩුකාරවර වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නිලූකා ඒකනායක,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

වර්ෂ 2018 සැප්තැම්බර් මස 11 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

**ආදාහනාගාරය පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

| | | |
|---|---|---|
| අතුරු ව්‍යවස්ථාවේ නාමය | 1. | රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය පවත්වාගෙන යාම විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| පූර්විකාව | 2. | බල ප්‍රදේශයේ ජනතාවගේ පහසුව හා සුභ සාධනය සහ සියළු පහසුකම් ආරක්ෂා කිරීම යටතේ ආදාහනාගාරය විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ මෙම අතුරු ව්‍යවස්ථාවල අන්තර්ගතය වේ. |
| අරමුණ | 3. | මෙම අතුරු ව්‍යවස්ථාව පැනවීමේ අරමුණ වනුයේ බල ප්‍රදේශයේ ජනතාවගේ පහසුව හා සුභ සාධනය ඇතුළුව ඊට අදාළ අනෙකුත් සියළුම තත්ත්වයන් විධිමත් කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම වේ. |
| අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන | 4. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත. |
| ඉටු කළ යුතු කාර්යයන් | 5<br>අ. | මෘත ශරීරයක් ආදහනය කිරීමට අය කරන ගාස්තු රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මතයක් මඟින් නියම කරනු ලැබිය හැකි අතර, එවැනිම යෝජනා සම්මතයක් මඟින් එකී ගාස්තු කලින් කල සංශෝධනය කළ හැකිය. |
| | ආ. | ඉහත ''අ'' ඡේදය යටතේ පනවනු ලබන හෝ කලින් කල සංශෝධනය කරන ගාස්තු *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, ආදහනාගාරය වෙන් කරවා ගැනීමට අයඳුම්පත් භාරගන්නා ස්ථානයේ සහ ආදාහනාගාරයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කළ යුතුය. |
| | 6 | අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන අවසර පත්‍රයක් ලබා ගැනීම අපේක්ෂා කරන (මෙහි මින් මතු ''ඉල්ලුම්කරු'' යනුවෙන් හඳුන්වනු ලබන) යම් තැනැත්තෙකු මෙහි පහත දැක්වෙන උපලේඛන සමග මෙහි දෙවන උපලේඛනයට සාරානුකූලව පිළියෙළ කල ඉල්ලුම්පත්‍රයක් සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුය. |
| | අ. | මියගිය තැනැත්තා හා ඉල්ලුම්කරු අතර සම්බන්ධතාව තහවුරු කිරීමට අදාළ කරගත හැකි වනු පිණිස -<br><br>(i) ඉල්ලුම්කරුගේ හැඳුනුම්පත,<br>(ii) මියගිය අයගේ උප්පැන්න සහතිකය (ඇත්නම්) හෝ හැඳුනුම්පත,<br>(iii) මියගිය තැනැත්තා පදිංචි වී සිටින කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ සහතිකය. |

| | | |
|---|---|---|
| | ආ. | මියගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ නියමයන් අනුව හදිසි මරණ පරීක්ෂකවරුන් හා උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර්වරුන් විසින් සහතික කොට පහත සඳහන් ආකෘතීන් වලින් ඉදිරිපත් කරනු ලබන මරණ සඳහා පමණක් ආදහනාගාරය වෙන් කර ගත හැකිය.<br><br>(i) B18 - මරණ පරීක්ෂක තැනගේ සහතිකය (39(1) 41(1) උ වගන්තිය)<br>(ii) B 16 - මරණ දැන්වීමේ සහතිකය (41(1) අ වගන්තිය<br>(iii) B20 - මරණ ලියාපදිංචි සහතිකය (42(1) ආ වගන්තිය<br>(iv) B 22 - මළ උප්පැන්න සහතිකය (43(1) (ඉ) වගන්තිය<br>(v) B 2 - මිය ගිය තැනැත්තාගේ මරණ සහතිකය. |
| | 7. | ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයකට අනුව යම් මෘත ශරීරයක් ආදහනය කිරීම සඳහා භාර ගැනීමට තීරණය කරන ලද්දේ නම් පළමුවන උපලේඛනයට අනුව පනවන ලද නියමිත ගාස්තුව අය කර ගැනීමෙන් පසුව සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඒ සඳහා වන අවසර පත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතුය. එකී අවසර පත්‍රයට අනුව ආදාහනය කිරීමට නියමිත මෘත ශරීරය ආදහනාගාර භාරකරු වෙත ගෙනැවිත් භාරදිය යුතු දිනය සහ වේලාව එකී අවසර පත්‍රයෙහි පැහැදිලිව සටහන් කර තිබිය යුතුය. |
| | 8. | කිසියම් හේතුවක් මත ආදාහනය කිරීම සඳහා මෘත ශරීරයක් භාර නොගන්නේ නම් සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඊට හේතු වූ කරුණු ද සමඟ ඒ බව වහාම ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැන්වීමක් කරනු ලැබිය යුතුය. |
| | 9. | සතියේ සෑම දිනකම පෙ.ව. 7.00 සිට ප.ව. 8.00 දක්වා කාලය ඇතුලත ආදාහනය කිරීම සඳහා මෘත ශරීර භාර ගැනීම හා ආදාහනය කිරීම කළ හැකිය. |
| | 10. | එකම දිනයක මෘත ශරීර කිහිපයක් ආදාහනය කිරීම සඳහා ඉල්ලුම්පත් භාර දී ඇති අවස්ථාවක, ඒ සඳහා වෙන් කරගත් නියමිත කාලවේලාව පසුවී ආදාහනා-ගාරය වෙත රැගෙන යනු ලබයි නම් නියමිත වේලාවට පැමිණි අයට අවස්ථාව ලබාදීමෙන් අනතුරුව ප්‍රමාද වී පැමිණි අයගේ මෘත ශරීර ආදාහනය කිරීමට කටයුතු කළ යුතුය. |
| | 11. | නිකුත් කළ අවසර පත්‍රයේ නිරූපිත වේලාවට හෝ ඊට පෙර මෘත දේහය ආදාහනාගාර භාරකරුට භාරදිය යුතුය. එකී වේලාවට මෘත දේහය භාරදීමට ප්‍රමාද වීම හේතුවෙන් ඉල්ලුම්කරුට හෝ මියගිය තැනැත්තාගේ අයිතිවාසිකම් ඇති වෙනත් යම් තැනැත්තෙකුට සිදුවන යම් අපහසුතාවයක් හෝ අලාභයක් සම්බන්ධයෙන් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව, සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා වගකීමට යටත් නොවිය යුතුය. |
| | 12. | සෑම ආදහනාගාරයකම ආදාහනය කරන ලද එක් එක් මෘත දේහය සම්බන්ධයෙන් III වන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද ලේඛනයක් ආදාහනාගාර භාරකරු විසින් පවත්වාගෙන යනු ලැබිය යුතුය. |
| | 13<br>අ. | සෑම මෘත දේහයක්ම ආදාහනයෙන් පසුව භෂ්මාවශේෂ තැන්පත් කිරීම සඳහා නම හා ලිපිනය ලියූ භාජනයක් සපයා දී තිබිය යුතු අතර, සෑම මෘත දේහයක්ම ආදාහනය කර පැය 72 ක් ගත වීමට මත්තෙන් ඉල්ලුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු විසින් එකී මෘත දේහයේ භෂ්මාවශේෂ භාර ගත යුතුය. |
| | ආ. | එසේ වුවද ඉල්ලුම්කරුගේ ලිඛිත ඉල්ලීමක් මත සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් එකී භාෂ්මාවශේෂ ආදාහනාගාර භාරකරුගේ භාරයේ තබා ගන්නා කාලසීමාව දීර්ඝ කිරීම කරනු ලැබිය හැකිය. |
| | ඇ. | ආ. ඡේදය යටතේ භෂ්මාවශේෂ ආදාහනාගාර භාරකරුගේ භාරයේ තබා ගැනීමට දීර්ඝ කරන කාලය ආදාහනය සිදු කළ දින සිට සති 02 කට නොවැඩි විය යුතුය. |

| | | |
|---|---|---|
| | ඇ. | එසේ භෂ්මාවශේෂ ඉවත් කර ගැනීමට ඉඩ දෙන ලද කාලය අවසන් වීමෙන් පසුව ද ඉවත් කර නොගත් භෂ්මාවශේෂ බැහැර කිරීම සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියාට හෝ ආදාහනාගාර භාරකරුට බලය තිබිය යුතුය. |
| නොකළ යුතු කාර්යයන් | 14<br>අ. | සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් නොමැතිව රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් කිසියම් ආදාහනාගාරයක කවර හෝ මෘත ශරීරයක් ආදාහනය නොකළ යුතුය. |
| | ආ. | මියගිය යම් තැනැත්තෙකුගේ මරණය සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනත යටතේ මහේස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු විසින් පරීක්ෂණයක් පවත්වනු ලැබ, එකී පරීක්ෂණය අවසානයේ මෘත දේහය ආදාහනය කිරීමට එකී මහේස්ත්‍රාත්වරයා හෝ හදිසි මරණ පරීක්ෂකවරයා අවසරයක් දී ඇත්තේ නම් මිස, එකි මෘත දේහය ආදාහනය කිරීමට භාර ගැනීම හෝ ආදාහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම හෝ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් නොකළ යුතුය. |
| | ඇ. | මියගිය යම් තැනැත්තෙකුගේ මරණ සහතිකයේ 7 වන තීරුවේ ''මරණයට හේතුව හා භූමදාන හෝ ආදාහනය කළ ස්ථානය'' යන්නෙහි රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ අදාළ ආදාහනාගාරය නම් කර සඳහන්ව ඇත්තේ නම් මිස, එකී මෘත දේහය ආදාහනය කිරීමට භාර ගැනීම හෝ ආදාහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් නොකළ යුතුය. |
| | 15<br>අ. | කිසියම් ආදාහනාගාරයක ආදාහනාගාර කුටීරයට මෘත දේහය ඇතුල් කර එහි ආරක්ෂිත දොර වසා දැමීමෙන් පසුව කුටීරය ආවරණය කළ කොටසට ආදාහනාගාර භාරකරු හෝ ඔහුගේ සහායකයන් හැර වෙනත් යම් තැනැත්තෙකු ඇතුළු වීම නොකළ යුතුය. |
| | ආ. | සභාපතිවරයාගේ, බලයලත් නිලධාරියාගේ හෝ ආදාහනාගාර භාරකරුගේ අවසරය නොමැතිව යම් ආදාහනාගාර පරිශ්‍රයකට ඇතුලු වීම නොකළ යුතුය. |
| | ඇ. | ආ ඡේදයේ කුමක් සඳහන්ව තිබුන ද,<br>(i) මෘත දේහයක් ආදාහනය කිරීමට යම් තැනැත්තෙකු අවසර පත්‍රයක් ලබා ඇත්තේ නම්, මෘත දේහය ආදාහනය සඳහා භාරදීමට ඔහු හෝ ඔහුගේ බලයලත් තැනැත්තෙකු සමඟ එකී අවස්ථාවට සහභාගී වන වෙනත් යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් ; සහ<br>(ii) ආදාහනය කරන ලද යම් මෘත දේහයක භෂ්මාවශේෂ භාරගැනීමට නියමිත දිනය හෝ එදිනට පෙර අවසර පත්‍රය ලබා ඇති තැනැත්තා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා සමඟ පැමිණෙන වෙනත් යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් ආදාහනාගාර පරිශ්‍රයට ඇතුල් වීමට අවසරය ලැබී ඇති තැනැත්තන් ලෙස සලකනු ලැබිය යුතුය. |
| | 16 | යම් ආදාහනාගාර පරිශ්‍රයක් තුළ,<br>අ. සාමය කඩවන ආකාරයෙන් හැසිරීම<br>ආ. ආදාහනාගාර පරිශ්‍රය ඇති රුවන්වැල්ල ප්‍රදේශීය සභාවට අයත් දේපළ වලට අලාභහානි කිරීම් හෝ එසේ කිරීමට තැත් කිරීම<br>ඇ. ආදාහනාගාර භාරකරුගේ හෝ ඔහුගේ යම් සහායකයෙකුගේ රාජකාරියට බාධා කිරීම<br>ඈ. ආදාහනාගාර පරිශ්‍රය තුළ කිසියම් සැරසිල්ලක් කිරීම හෝ දැන්වීම් ඇලවීම නොකළ යුතුය.<br>ඉ. ආදාහනාගාරය වෙන් කරනු ලබන අයෙකුගෙන් යම් දේපළකට හෝ ගොඩනැගිල්ලකට හෝ උපකරණයකට අලාභයක් වුවහොත් සභාපතිවරයා නියම කරනු ලබන තක්සේරු වටිනාකම ගෙවීමට ආදාහනාගාරය වෙන් කරනු ලබන අය එකඟවිය යුතුය. |

| | | |
|---|---|---|
| | 17. | සභාවේ සේවය කළ හෝ දැනට සේවය කරන සභාපතිවරයෙකුගේ, උප සභාපතිවරයෙකුගේ, මන්ත්‍රීවරයෙකුගේ හෝ සභාවේ සේවකයෙකුගේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා ගාස්තු අය නොකිරීම. |
| පළාත් පාලන ආයතනයේ කාර්යය භාරය | 18. | මෘත ශරීරයක් ආදාහනය කිරීමට අවසර පත්‍රයක් ඉල්ලා ඉදිරිපත් කරන ඉල්ලුම්පත්‍රයක් මත අවසර පත්‍රයක් නිකුත් කිරීමට තීරණය කරන ලද්දේ නම් එවැනි අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව මෙහි IV උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ ලේඛනයක ලේඛන ගත කිරීම සභාපතිවරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ කාර්ය වන්නේය. මේ ලේඛනය අයදුම්පත් භාරගන්නා රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ කාර්යාලයේ පවත්වාගත යුතුය. |
| | 19. | කිසියම් හේතුවක් මත ආදාහනය කිරීම සඳහා මෘත ශරීරයක් භාර නොගන්නේ නම් සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඊට හේතු වූ කරුණු ද සමඟ ඒ බව වහාම ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැන්වීමක් කිරීමට කටයුතු කිරීමට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතුය. |
| | 20. | කිසියම් ඉල්ලුම්කරුවෙකු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු විසින් භාර නොගත් භෂ්මාවශේෂ ආදාහනාගාර පරිශ්‍රයේ හෝ යම් සුසාන භූමියක වල දැමීමට කටයුතු සැලැස්වීම සභාපතිවරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය වන්නේය. |
| | 21. | මෘත ශරීරය ආදාහනය කිරීමට සුදුසු තත්ත්වයකින් ආදාහනාගාර නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම සභාපතිවරයාගේ කාර්යය විය යුතුය. |
| | 22. | යම් ආදාහනාගාරයක් ප්‍රතිසංස්කරණය කිරීමේ හෝ නඩත්තු කිරීමේ කාර්යය සඳහා එකී ආදාහනාගාරය වසා තබන්නේ නම්, ඒ පිළිබඳ නිවේදනයක් භාෂාත්‍රයෙන්ම මෘත දේහ ආදාහනය සඳහා අවසර පත් නිකුත් කරන කාර්යාලයේ සහ ආදාහනාගාර පරිශ්‍රයට ඇතුල් වන ස්ථානයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතුය. |
| | 23. | කිසියම් මෘතදේහයක් ආදාහනය කිරීම සඳහා භාරගැනීමෙන් පසු හෝ කුටීරයට ඇතුල් කිරීමෙන් පසු සිදුවන තාක්ෂණික දෝෂයක් මත හෝ වෙනත් තාක්ෂණික දෝෂයක් මත දේහය ආදාහනය කිරීමට නොහැකි වන අවස්ථාවක, එම මෘත දේහය භූමදානය කිරීම හෝ ආදාහනය කිරීම සඳහා වෙනත් ආදාහනාගාරයක් වෙත යොමු කිරීමේ බලය සභාපතිවරයා සතු වේ. |
| බලය පැවරීම | 24. | මෙම අතුරු ව්‍යවස්ථාවන්ට අදාළ කටයුතු නිගමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලය එහි සභාපතිවරයා විසින් සභාවේ කවර හෝ නිලධාරියෙකුට ලිඛිතව පවරා දීම නිත්‍යානුකූල වන්නේය. |
| පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධීක්ෂණය | 25. | පරීක්ෂා කිරීමේ බලධාරියා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ බලය පවරනු ලැබූ නිලධාරියෙකු වේ. |
| පැමිණිලි හා පිලියම් යාන්ත්‍රණය | 26. | මෙම අතුරු ව්‍යවස්ථාවන් උල්ලංඝනය හෝ කඩ කිරීම් සිදු වන ඕනෑම අවස්ථාවකදී ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ අදාළ බලධාරීන්ට හෝ ලිඛිතව හෝ වාචිකව ඕනෑම අවස්ථාවකදී වාර්තා කිරීම හෝ පැමිණිලි කිරීම ඕනෑම පුරවැසියෙකුට සිදු කළ හැකිය. එවන් සෑම පැමිණිල්ලක් සම්බන්ධයෙන්ම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා හෝ පරීක්ෂාකර බැලිය යුතුය. |
| අධීක්ෂණය | 27. | මෙම අතුරු ව්‍යවස්ථාවල දක්වෙන විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ පරීක්ෂා කිරීම හෝ අධීක්ෂණය කිරීමේ බලතල ප්‍රාදේශීය සභාවේ සභාපති හෝ ඔහු විසින් බලය පවරා ඇති නිලධාරියෙකු සතු වේ. |

| | | |
|---|---|---|
| අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම | 28. | මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම කඩ කිරීම වරදක් වන්නේය. |
| දඩ හා දණ්ඩන | 29. | මෙම අතුරු ව්‍යවස්ථාවේ ඇතුලත් ඕනෑම වගන්තියක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, කිසියම් තැනැත්තෙකු නිසි අධිකරණයකින් වරදකට වරදකරු කරනු ලැබූ විට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වගන්තිය අනුව නියම කර ඇති දඩයකින් ද වරදකරු කරනු ලැබීමකින් පසුවද එම වරද දිගින් දිගටම කරගෙන යනු ලබයි නම් එකී කාරණය කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පවරනු ලබන වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසුවද ඒ වරද කරගෙන යන සෑම දිනයක් සඳහාම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තිය අනුව නියම කර ඇති අතිරේක දඩයකට යටත් විය යුතුය. |
| අර්ථ නිරූපන හා නිර්වචන | 30. | පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල- |
| | (අ) | ''ආදාහන කුටීරය'' යන්නෙන්, ආදාහනය කිරීම සඳහා මෘත දේහය තැන්පත් කරන කුටීරය සහ එකී කුටීරයට පිටතින් සාදන ලද බාහිර කුටීරය ද, |
| | (ආ) | ''ආදාහනාගාර පරිශ්‍රය'' යන්නෙන් සම්පූර්ණ ආදාහනාගාරය සහ ඊට අයත් භූමිය ද, |
| | (ඇ) | ''ආදාහනාගාර භාරකරු'' යන්නෙන්, තත් කාලයේදී රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය සහ එහි කටයුතු භාරව සිටීමට පත් කරනු ලැබ ඇති යම් සේවකයෙකු ද, |
| | (ඈ) | ''භස්මාවශේෂ'' යන්නෙන්, යම් මෘත දේහයක් ආදාහනය කිරීමෙන් අනතුරුව, මෘත දේහයේ සහ එය තැන්පත් කර තිබූ යම් පෙට්ටියක නොදැවී ශේෂ වන යම් ද්‍රව්‍යයන් ද, |
| | (ඉ) | ''මෘත ශරීරය''යන්නෙන්, මියගිය කිසියම් තැනැත්තෙකුගේ සම්පූර්ණ මෘත දේහය හෝ අජීවී දරු උපතක මෘත දේහය හෝ යම් මෘත දේහයකින් කිසියම් කොටසක් ද, අදහස් විය යුතුය. |
| | 31. | මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙමළ හා ඉංග්‍රීසි පිටපත්වල යම් නොගැළපීමක් ඇතිවුවහොත් සිංහල පිටපත බලාත්මක වේ. |

**I වන උපලේඛනය**

*ආදාහනාගාරය පාවිච්චි කිරීමේදී අයකරන ගාස්තු*

*රු. ශත*

| | | | |
|---|---|---|---|
| 01. | බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | - | 6,000 0 |
| 02. | බල ප්‍රදේශයෙන් පිටත පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | - | 7,000 0 |

**II වන උපලේඛනය**

*රුවන්වැල්ල ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය*

01. මෘත ශරීරය ආදාහනය සඳහා ඉල්ලුම් කරන්නාගේ නම :...........................................................................................................

- ලිපිනය :..........................................................................................................................................
- ජාතික හැඳුනුම්පත් අංකය :..............................................................................................................
- දුරකථන අංකය :.................................................................................................................................
- මිය ගිය තැනැත්තාට ඉල්ලුම්කරුගේ සම්බන්ධය :.............................................................................

02. මියගිය තැනැත්තාගේ නම :

- ජාතික හැඳුනුම්පත් අංකය :.............................................................................
- පදිංචි වී සිටි ලිපිනය :......................................................................................
- ග්‍රාම සේවා කොට්ඨාසය :...................................................................................

03. මරණය සිදු වූ ආකාරය :.................................................................................................................................

04. මරණ සහතිකයේ අංකය හා දිනය :.......................................................................................................
(මරණ සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

05. මරණය ලියාපදිංචි කළ රෙජිස්ට්‍රාර්ගේ නම හා ලිපිනය :.....................................................................

06. මරණය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම් දිනය හා වේලාව :...................................................

- පරීක්ෂණ නිලධාරියාගේ නම හා තරාතිරම :.........................................................................
- පරීක්ෂණ නිලධාරියාගේ නිගමනය :......................................................................................
- මෘත ශරීරය ආදාහනය කිරීමට අවසර ලබා දෙන්නේ ද යන වග : ඔව්/නැත

07. ආදාහනය කිරීමට අවශ්‍ය දිනය හා වේලාව : දිනය :...................................................
වේලාව :...............................................

08. ආදාහනයෙන් පසු භෂ්මාවශේෂ තැන්පත් කිරීම සඳහා නම හා ලිපිනය ලියූ භාජනයක් සපයා දී ඇත/නැත.

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල නිවැරදි හා සත්‍ය බව සහතික කරමි.
අදාල සහතික අමුණා ඇත.

..................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :..............................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි**

01. අවසර පත්‍රය නිකුත් කිරීම සඳහා අනුමත කරමි/ පහත සඳහන් හේතු මත අවසර පත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරමි.

.....................................................................................................................................................................

............................................................,
සභාපති,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

බලයලත් නිලධාරියා,

01. ලේඛනයේ සටහන් කරන ලදී.

................................................ දින සිට............................................................ දරන ලදුපතකින් රු.................................... ක් අය කරගන්නා ලදී.

02. අවසර පත්‍රය අත්සන සඳහා ඉදිරිපත් කරමි.

03. ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වූයේ නම් අදාළ කරුණු ඇතුළත් ලිපිය අත්සන සඳහා ඉදිරිපත් කරමි.

..................................................,
අත්සන.

දිනය :........................................

**III** වන උපලේඛනය

*රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ ආදාහනය කරන ලද මෘත දේහ පිළිබඳ ලේඛනය*

| අනු. අංකය | මියගිය අයගේ නම | ජා. හැ. ප. අංකය | ස්ත්‍රී/පුරුෂ භාවය | අවසරපත් ලේඛනයේ අනු. අංකය | මියගිය දිනය | මරණ සහතිකයේ ලියාපදිංචි කළ | | ඉල්ලුම්කරුගේ | | අවසරපත් අංකය | ලදුපතේ | | ආදාහනය කළ | | භස්මාවශේෂ ගෙන ගිය දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අංකය | දිනය | නම | ජා.හැ.ප. අංකය | | අංකය | මුදල රු. ශත | දිනය | වේලාව | |
| 01. | | | | | | | | | | | | | | | |
| 02. | | | | | | | | | | | | | | | |
| 03. | | | | | | | | | | | | | | | |
| 04. | | | | | | | | | | | | | | | |

**IV** වන උපලේඛනය

*රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ මෘතදේහ ආදාහනය කිරීමට නිකුත් කරන ලද අවසර පත්‍ර ලේඛනය*

| අනු. අංකය | මියගිය අයගේ නම | ජා. හැ. ප. අංකය | ස්ත්‍රී/පුරුෂ භාවය | මියගිය දිනය | මරණ සහතිකයේ ලියාපදිංචි කළ | | ඉල්ලුම්කරුගේ | | | | මහෙස්ත්‍රාත්/හදිසි මරණ පරීක්ෂක නියෝගය | | අවසරපත් අංකය | ලදුපතේ | | ආදාහනය සඳහා වෙන් කළ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අංකය | දිනය | නම | මරණකරු වෙත ඇති නෑකම | ලිපිනය | ජා.හැ.ප. අංකය | යොමු අංකය | දිනය | | අංකය | මුදල රු. ශත | දිනය | වේලාව |
| 01. | | | | | | | | | | | | | | | | | |
| 04. | | | | | | | | | | | | | | | | | |

10-312

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.